31.07.2019

# ද මැසිනොද් විදුහල,කඳාන

## දෙවන වාර පරීක්ෂණය - 2019

| | |
|---|---|
| ඉතිහාසය I | 11 ශ්‍රේණිය |

විභාග අංකය :.................................... කාලය පැය 01 යි

උපදෙස්
* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
*මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 40කි.
*අංක 01සිට 40 තෙක් ඇති ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
*ඔබට සපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුල (x) ලකුණ යොදන්න.

---

01. ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍යය මූලාශ්‍රයන් අතර පැරණිතම වංසකතාව ලෙස සැලකනුයේ,

1.මහාවංසය 2.දීපවංසය

3.ථූපවංසය 4.ධාතුවංසය

02.ශ්‍රී ලංකාවට පැමිණ මෙහි තතු දැක බලා ඒ පිළිබඳව වාර්තා කැබූ පෘතුගීසි ජාතිකයා වන්නේ,

1.පිලිප්පස් බැල්ඩියස් 2.රොබට් නොක්ස්

3.ෆර්නාඕ ඩි ක්වෙරොස් 4.ජොආඕ රිබෙයිරෝ

03.මහානාම හිමියන් විසින් සම්පාදිත පාලි මහාවංස කතාවට සපයන ලද පාලි ටීකාව වනුයේ,

1.අභිධානප්පදීපිකා 2.සාරත්ථදීපනි

3.වංසත්ථප්පකාසිනි 4.භේසජ්ජ මංජූසා

04.ශිලා ලිපිවල දුන්න, ඊතලය , ගොන් කුරය ,ඇත්අඩියව වැනි රූප මගින් නිරූපණය කර ඇත්තේ,

1.ප්‍රාදේශීය මායිම්ය. 2.වටිනා පුරාවස්තු සහිත ස්ථානයන්ය.

3.දඩයම් ප්‍රදේශයන්ය. 4.රජවරුන්ගේ නිල මුද්‍රා සලකුණුය.

05.ඉතිහාසය විෂයක් ලෙස හදාරන්නෙකු,

1.මූලාශ්‍ර අධ්‍යනය සමග බැඳෙයි.

2.අතීත මිනිස් ක්‍රියාකාරකම් හදාරයි.

3.තර්කානුකූල මතවාදවලට නොඑළඹෙයි.

4.අනාගත සමාජ වගකීම් අත දරයි.

06. පහත රට තෙත් කලාපයේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ වැදගත් තොරතුරු අනාවරණය කරන වාසස්ථානයක් වනුයේ,

1.උඩමළල 2.අත්තනගොඩ අළුලෙන

3.බුලත්සිංහල පාහියන්ගල 4.මිනිහාගල්කන්ද

07. පූර්ව ඓතිහාසිකයුගයට අයත් ඉපැරණි ජනාවාසයක නටබුන් හමු වූ ස්ථානයක් නොවන්නේ මින් කුමක්ද?

1.හල්දුම්මුල් 2 බෙල්ලන්බැඳිපැලැස්ස

3.උඩරංචාමඩම 4.වළගම්පත්තුව

08. .ක්‍රිස්තු පූර්ව 180 සිට ක්‍රිස්තු වර්ෂ 200 දක්වා පමණ කාලය තුළ ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණ සිදු කළ බවට සාක්ෂි ලැබෙනුයේ,

1.ඌව බෙරගල ප්‍රදේශයෙනි. 2.දෙහිගහ ඇළකන්ද ප්‍රදේශයෙනි

3. බලංගොඩ සමනලවැව ප්‍රදේශයෙනි. 4. රත්නපුර ගල්පාය ප්‍රදේශයෙනි.

Learning Resource Center R De Mazenod College Kandana

09.අතීත පාලකයන් පරිසරය ආරක්ෂා කිරීමේ වැදගත්කම නිරන්තරයෙන් සිහි කළ බව ඔප්පු කර දක්වන ශිලා මූලාශ්‍රය වන්නේ ,

1.අනුරාධපුර පුවරු ලිපිය

2.කණ්ඩලම කොත්ගල්කන්ද සෙල්ලිපිය

3.කොරවක්ගල සෙල්ලිපිය

4.මණ්ඩගල සෙල්ලිපිය

10.දකුණු ඉන්දියානු කුලී භේවායන්ගේ සහය පැතූ පැරණිතම ශ්‍රී ලංකික පාලකයෙකු වනුයේ,

1.කීර්ති ශ්‍රී මේඝවර්ණාභය රජු 2.පළමුවන ගජබාහු රජු

3.අභයනාග රජු 4.සාහස්සමල්ල රජු

11. රජරට ශිෂ්ටාචාර සමයට අයත් සංස්කෘත භාෂාවෙන් රචිත ග්‍රන්ථ පමණක් අඩංගු කාණ්ඩය වන්නේ,

1.පාරමී ශතකය ,ජිනබෝධාවලි ,ජානකීහරණය

2.යෝගාර්ණවය , සාරසංග්‍රහය,අනුරුද්ධසතකය

3.සියබස්ලකර , සසදාවත , බාලාවබෝධය

4. ජානකීහරණය, බාලාවබෝධය, අනුරුද්ධසතකය

12.අනුරාධපුර වීරංකුර පන්සලේ වාසය කළ භික්ෂූන් වහන්සේලාට රන් කලං 200ක් පූජා කල රජු කවුද?

1.Vමහින්දු රජු 2. III උදය රජු

3.IVකාශ්‍යප රජු 4.V කාශ්‍යප රජු

13.පුරාණ කාලයේ මහවැලි ගඟේ අතු ගංගාවක් වන අඹන් ගඟ හරස් කර ඉදි කරන ලද ඇළහැර ඇළෙන් ජලය ලබා දුන් වාපි ද්විත්වය වන්නේ ,

1.තිසා වැව හා කලා වැව

2.කන්තලේ වැව හා පදවිය වැව

3.මින්නේරිය වැව හා නාච්චදූව වැව

4.කවුඩුල්ල වැව හා ගිරිතලේ වැව

14.අපේ පැරන්නන් විසින් ජලයේ ගම්‍යතාවය ඉතා හොඳින් අවබෝධ කරගත් විශිෂ්ට වාරි නිර්මාණයක් ලෙස සැලකිය හැක්කේ,

1. ඌරා කෑට ළිං 2.සීගිරි ජල මල්

3.යෝධ ඇළ 4.සොරොව්ව

15.එකල වැව්වලට සිට කුඹුරු කරා විහිදෙන ඇළ මාර්ග වල මාළු ඇල්ලීම වෙනුවෙන් රජය විසින් අය කළ බද්ධ වනුයේ,

1.බොජකපති 2.කෙටු කනබ

3.මතරමජිබක 4.දකපති

16.පහත සිදුවීම් අතරින් ගම්පොළ රාජධානියේ අවසාන කාලයේ ජීවත් වූවෙකුට අසන්නට නොලැබෙන සිදුවීම මින් කුමක්ද?

1 ජෝතිය සිටුවරයාගේ උඩරට කැරැල්ල.

2.චෙන් හෝ සෙනවියාගේ ආක්‍රමණය

3.ඉබන් බතුතාගේ ලංකාගමනය

4.නිශ්ශංක අලකේශ්වර විසින් කෝට්ටේ බලකොටුවක් ඉදි කිරීම.

17.පෘතුගීසි වෙළඳ නැව්වලට බාධා එල්ල කරමින් කතෝලික ආගම පැතිර වීමට එරෙහිව කටයුතු කළ යාපන රාජධානි පාලකයා වන්නේ,

1.පරරාජසේකරම් රජු 2.එදිරිමානසිංහම් රජු

3.සංකිලි රජු 4.පුවිරාජපණ්ඩාරම් රජු

18.පෘතුගීසීන් විසින් ශ්‍රී ලංකාව හැදින්වීම සඳහා භාවිතා කල නාමය,

1.සෙරන්ඩිබ් 2.තැප්‍රෝබේන් 3.සෙයිලන් 4.තම්බපණ්ණි

19.පහත වගුවෙහි දැක්වෙන තීරු අතර නිවැරදි සම්බන්ධතාවයක් දැක්වෙන වරණය තෝරන්න.

| I තීරය | II තීරය | III තීරය |
|---|---|---|
| A. 1602 | D. කොන්ස්තන්තීනු ද සා | G. I විමලධර්මසූරිය රජු |
| B. 1630 | E. දියෝගු ද මෙලෝ | H. II රාජසිංහ රජු |
| C. 1638 | F. දොන් ජෙරනිමෝද අසවේදු | I. සෙනරත් රජු |

1.CDH 2.BDI 3.AFI 4.BFI

20. ක්‍රි.ව. වර්ෂ 1602 දී ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම ලන්දේසි දූතයා වනුයේ

1.සිබල් ද වර්ට් 2.බැරන් වැන්

3.පිලිප් ද ඔලිවේරා 4.ජෝරිස් වැන් ස්පිල්බර්ජන්

21.පහත දැක්වෙන වර්ෂ සඳහා නිවැරදි ගැළපුම සහිත පිළිතුර වන්නේ,

1.1865 A. ගම්පොළවාදය

2.1866 B. පානදුරාවාදය

3.1871 C. උදන්විටවාදය

4.1873 D. වරාගොඩ වාදය

1 DACB 2.CBAD 3.CDAB 4.DCAB

22.උඩරට ආක්‍රමණ සඳහා පසුබිම සකසනු වස් කාර්යශූර සිවිල් සේවක ජෝන් ඩොයිලිව යොදාගත් ආණ්ඩුකාරවරයා කවුද?

1.රොබර්ට් බ්‍රවුන්රිග් 2.තෝමස් මේට්ලන්ඩ්

3.ෆෙඩ්රික් නොර්ත් 4.ෆන් එංගල්බෙක්

23.දෙවන නිදහස් අරගලයට උරදුන් නායකයන් පමණක් ඇතුලත්වන වරණය තෝරන්න.

1.වීරපුරන් අප්පු , ගොන්ගාලේ ගොඩබණ්ඩා 2.ඇහැලේපොළ , ගොන්ගාලේ ගොඩබණ්ඩා

3.කැප්පෙටිපොළ, මඩුගල්ලේ 4..කැප්පෙටිපොළ, දිනෙස්

24.අනුරාධපුරයේ පූජනීය ස්ථාන ආරක්ෂා කර ගැනීමේ ජාතික ව්‍යාපාරයක් ආරම්භ කළ පුද්ගලයා වනුයේ,

1.අනගාරික ධර්මපාලතුමා 2.දොන් කරෝලිස් හේවාවිතාරණතුමා

3.වලිසිංහ හරිස්චන්ද්‍රතුමා 4.පියදාස සිරිසේන මහතා

31.07.2019 11 ශ්‍රේණිය

ඉතිහාසය I

- පහත A හා B දක්වා ඇති ප්‍රකාශ ඇසුරෙන් 25 සිට 27දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

A -අමද්‍යප ව්‍යාපාරය ඇරඹීම.

B -ප්‍රථම අගමැතිවරයා බවට පත් වීම

C - ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති

D -සිංහල බෞද්ධයා පුවත්පතට ලිපි ලිවීම

E - ගොවි ජනපද ව්‍යාපාර ඇරඹීම

F - හින්දු පුනර්ජීවන ව්‍යාපාරයට උර දීම

25. අනගාරික ධර්මපාල තුමා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක්ද ?

1.A හා C 2.B හා D 3 .D හා E 4.A හා D

26. පොන්නම්බලම් අරුණාචලම් මහතා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක්ද?

1.C හා F 2.A හා C 3.D හා F 4.F හා A

27. ඩී.එස්. සේනානායක මහතා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක්ද?

1 .A හා E 2.B හා E 3.B හා D 4.D හා E

28. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක සභාවට නියෝජිතයන් තෝරාපත් කර ගැනීම සඳහා ප්‍රථම වරට ඡන්ද බලය හඳුන්වාදුන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය වනුයේ,

1.කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය 2.මැනිං ඩෙවන්ෂයර් ප්‍රතිසංස්කරණය

3.ක්‍රෲව් මැකලම් ප්‍රතිසංස්කරණය 4.ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

- ප්‍රශ්න අංක 29 සිට 30 දක්වා ප්‍රශ්නවල අසා ඇති ප්‍රකාශන හා සම්බන්ධ නිවැරදි පිළිතුරු තෝරන්න.

29. ලංකාවේ ජාතික ව්‍යාපාරය,

1.යටත් විජිත පාලනයෙන් නිදහස ලබාගැනීම සඳහා දැඩි ලෙස උද්ඝෝෂනයේ යෙදිනි.

2.ජාතික අනුකලනය ගොඩනැගීම සඳහා දැඩි ලෙස උනන්දු විය .

3.බටහිරකරණය වූ සමාජීය ප්‍රභූන් විසින් ආරම්භ කොට නායකත්වය දිනි.

4.සමාජයේ සෑම වාර්ගික කණ්ඩායමකම සහභාගිත්වය ලද ව්‍යාපාරයකි

30. ඩොනමෝර් ප්‍රතිසංස්කරණය යටතේ පිහිට වූ රාජ්‍ය මන්ත්‍රණ සභාව,

1.සාමාජිකයන් 50 දෙනෙකු ජනතා ඡන්දයෙන් තේරී පත් වීම.

2.මුලසුන හොබවන ලද්දේ ආණ්ඩුකාරවරයා විසිනි.

3.රාජ්‍ය පාලනය කිරීමේ පූර්ණ බලය ස්වදේශික අමාත්‍ය වරුන් යටතට පැවරිණි.

4.සුළු ජාතීන් නියෝජනය නොවිණි.

Learning Resource Center
R
De Mazenod College
Kandana

31. බ්‍රිතාන්‍යයන් යටතේ වතු වගාවක් ලෙස වඩාත් දියුණු වූ කෝපි වගාව විනාශ වී යාමට බලපෑ ආසන්නතම හේතු සාධකය වනුයේ,

1.ලෝක ආර්ථික පරිහානිය.

2.කෝපි වගාව සඳහා අඩි 6000කට වඩා ඉහළ භූමි ප්‍රදේශයක් අවශ්‍ය වීම.

3.බ්‍රිතාන්‍ය නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය.

4.හෙමිලියා වෙස්ටර්ට්‍රික්ස් නමැති කෝපි කොළ රෝගය පැතිරී යාම.

32. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ආණ්ඩුක්‍රමයේ සුවිශේෂී ලක්ෂණයක් වනුයේ,

1.ව්‍යවස්ථාදායකයේ ස්වාධීනත්වය දැඩි ලෙස අවධාරණය කර තිබීම.

2.ද්වි මණ්ඩලික ව්‍යවස්ථාදායකයක් නිර්මාණය වීම.

3. අධිකරණ ස්වාධීනත්වය සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවක් පිහිටු වීම.

4. සත්‍ය විධායකයේ නායකයා විසින් නාමික විධායකය පත් කිරීම.

33. මෙරට වතු කම්කරුවන් අතර වෘත්තීය සංගම් පිහිටුවීමට නායකත්වය සපයන ලද්දේ,

1.ඒ.ඊ ගුණසිංහ　　2.නටේස අයියර්

3.එන්.එම්.පෙරේරා　　4.එස්.ඒවික්‍රමසිංහ

34. මැතිවරණයකදී ශ්‍රී ලංකාව එකම ඡන්ද කොට්ඨාසයක් බවට පත්වන අවස්ථා ඇතුලත් වරණය තෝරන්න.

1.ජනාධිපතිවරණය හා මහ මැතිවරණය

2. ජනාධිපතිවරණය හා ජනමත විචාරණය

3.පළාත් මැතිවරණය හා ජනමත විචාරණය

4. ජනාධිපතිවරණය හා පළාත් සභා මැතිවරණය

- යුරෝපා පුනරුද සමයේ ඉදිරිපත්වන ලද පහත සඳහන් මත ඇසුරින් 35 – 36 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පෘතුවිය ගෝලාකාර බව සොයා ගැනීම

B - ලෙඩ රෝග සෑදීමට තුඩුදෙන හේතු සොයා ගැනීම

C - රෝග චිකිත්සක ක්‍රම සොයා ගැනීම.

D - නූතන තාරකා විද්‍යාවේ පියා

35. ස්විස් ජාතික වෛද්‍ය පැරසල්සස් සම්බන්ධ ප්‍රකාශය කුමක්ද?

1 Aහා D　　2.B හාD　　3.Bහා C　　4.C හා D

36. පෝලන්ත ජාතික නිකලස් කොපර්නිකස් සම්බන්ධ ප්‍රකාශය කුමක්ද ?

1.B හා D　　2.A හා C　　3.A හා D　　4.C හා A

37. පහත දැක්වෙන පිළිතුරු අතරින් යුරෝපයේ පුනරුදය සමග බිහි වූ දේශ ගවේෂකයන් හා ඔවුන් සොයා ගත් රටවල් නිවැරදි ලෙස ගලපා ඇති පිළිතුර කුමක්ද?

| A | B |
|---|---|
| 1.බටහිර ඉන්දීය දූපත් | Aෆර්ඩිනන්ඩ් මැගලන් |
| 2.ඇමරිකාව | B ක්‍රිස්ටෝපර් කොලොම්බස් |
| 3.පිලිපීනය | C කැබේ සහෝදරයන් |
| 4.කැනඩාව | D ඇමරිගෝ වෙස්පුචි |

1.BDAC　　2.DBAC　　3.BDAC　　4.ABDC

38.කාර්මික විප්ලවයේ දිර්ඝ කාලීන බලපෑමට හසු වූ ශ්‍රී ලංකාවේ කොළඹ - මහනුවර මහාමාර්ගය ඉදි වූයේ කුමන ආණ්ඩුකාරවරයා යටතේද ?

1.ෆෙඩ්රික් නෝර්ත්

2.හෙන්රි වෝඩ්

3.එඩ්වඩ් බාන්ස්

4.තෝමස් මෙට්ලන්ඩ්

39. පළමු වන ලෝක යුධ සමයේ මධ්‍යම බලවතුන්ගේ රටවල් 02ක් වනුයේ,

1.ඔස්ට්‍රියාව , ප්‍රංශය

2.බ්‍රිතාන්‍ය,රුසියාව

3.ඇමරිකාව ,හංගේරියාව

4.තුර්කිය , ජර්මනිය

40.පළමු ලෝක යුද්ධය අවසානයේ විවිධ ජන වර්ග සදහාම් කරගෙන බිහිවූ නිදහස් රාජ්‍යයක් වනුයේ,

1.පෝලන්තය

2.පෘතුගාලය

3.ඇබිසීනියාව

4.ඉතාලිය

31.07.2019

De Mazenod College Kandana De Mazenod College Kandana De Mazenod College Kandana De Mazenod College Kandana

# ද මැසිනොද් විදුහල,කඳාන

## දෙවන වාර පරීක්ෂණය - 2019

| ඉතිහාසය II | | 11 ශ්‍රේණිය |
| --- | --- | --- |
| විභාග අංකය :........................................ | | කාලය පැය 03 යි |

උපදෙස් *I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
*II කොටසේ ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකටද පිළිතුරු සපයන්න.
*පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

---

### I කොටස

1. (අ) පහත (I) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (II) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහිද ලකුණු කර නම් කරන්න.

i. කෝනේශ්වරම්, දෙවිනුවර, බදුල්ල,සල්වතොට, පොම්පරිප්පු, කලා ඔය, මඩකලපුව, කැළණි ගඟ, යටිගල්පොත්ත, කන්තලේ වැව, මහනුවර, මාන්තායි

(ලකුණු 12)

ii. කල්කටා, මලක්කා සමුද්‍ර සන්ධිය, පර්සියන් බොක්ක, ජාවා දූපත, වැනීසිය, කළු මුහුද


(ලකුණු 06)

(ආ) (I) පහත A,B,C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුර අනුපිළිවෙලින් පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

(I) A. I විජයබාහු රජුට කුඩාකල සිට රැකවරණය සැපයූ දණ්ඩනායකවරයා
B. ක්‍රි.ව. 1762 උඩරටට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි දූතයා
C. නාගරික කම්කරුවන් ඒකරාශී කිරීමට මූලිකත්වය ගත් පුද්ගලයා.
D. ජර්මනිය නමින් රටක් බිහිකළ නායකයා

(ලකුණු 04)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යානය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



(II) 1. A අක්ෂරයෙන් දක්වා ඇති රූපය කුමක්ද?
2. මෙය හමුවූයේ කුමන ස්ථානයකින්ද?
3. මෙ සඳහා යොදාගෙන ඇති විද්‍යාත්මක මූලධර්මය කුමක්ද?
4. මෙමගින් පැරණ්නන් සතු වූ කුමන අංශයක් පිළිබඳ හෙළිදරවු කරයිද?

(ලකුණු 04)



(III) 1. B වලින් දැක්වෙන චිත්‍රයේ නිරූපිත පුද්ගලයාගේ නම කුමක්ද?
2. මොහු කුමන ජාතිකයෙක්ද?
3. මොහුගේ මග පෙන්වීම යටතේ පිහිටවූ සමාගම කුමක්ද?
4. මෙතුමාගේ මැදිහත්වීමෙන් පුනරුද සමයේ සිදු වූ වැදගත් සිදුවීමක් ලියන්න.

(ලකුණු 04)

Learning Resource Center R De Mazenod College Kandana

## II කොටස

02. i. A - ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මෙවලම් හමු වූ පාංශු තැන්පතුව හැඳින්වෙන නම ද

B- ප්‍රාග් මානවයාට අයත් වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන 02ක් ද ලියන්න.

(ලකුණු 03)

ii . රූපයේ දැක්වෙන A හා B කලාප පිළිවලින් නම් කර ඒවායේහි පිහිටි ප්‍රාග් මානවයාගේ ගල්ගුහා වාසස්ථාන 02 ක් නම් කරන්න.




(ලකුණු 04)

iii. ප්‍රාග් මානවයාගේ ජීවන රටාවේ මූලික ලක්ෂණ කරුණු 02ක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

iv . පූර්ව ඓතිහාසික යුගයේ ව්‍යවහරික විද්‍යාවේ විද්‍යාත්මක පරිණතිය පිළිබිඹු වන අවස්ථා 03 ක් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

03 . i. පැරණි සමාජයේ ගම්කයන් විසින් ඉටුකළ කාර්යයන් 03ක් ලියන්න. (ලකුණු 03)

ii . ශ්‍රී ලංකාවේ ඓතිහාසික සමාජයට අයත් සහත දැක්වෙන A,B,C හා D සඳහා සෙල්ලිපිවල යෙදුනු ඓතිහාසික ව්‍යවහාරයන් ලියන්න.

A- නාගරික වස්තු විද්‍යාඥ

B- රාජකීය නිලධාරීන්

C- සාමාන්‍ය ජනතාව

D- කාසි අච්චු ගැසීම භාර නිලධාරියා

(ලකුණු04)

iii. පැරණි සමාජයේ රාජ්‍යත්වය උරුම වූ ආකාර 02ක් විස්තර කරන්න.

(ලකුණු05)

iv . ශ්‍රී ලංකා ඉතිහාසයේ වසභ රජුගේ පාලන කාලයේහි ඇති වැදගත්කම කරුණු 03ක් ඇසුරෙන් පැහැදිලි කරන්න

(ලකුණු 06)

04. i. A-අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා

B- පොළොන්නරු රාජධානියේ ආරම්භක පාලකයා

C - රජරට ශිෂ්ටාචාරයේ ඉරණමට ප්‍රබල බලපෑමක් කළ අකමණිකයා නම් කරන්න.

(ලකුණු 03)

ii දෙවන නාගරීකරණය සමග මලය රටේ බිහි වූ රාජධානි 02ක් ද මායා රටේ බිහි වූ රාජධානි 02ක් ද නම් කරන්න

(ලකුණු04)

iii. දෙවන නාගරීකරණය සමග බිහි වූ රාජධානිවල භාෂා සාහිත්‍ය සහ ගෘහ නිර්මාණ කලාවේ ප්‍රබෝධය කරුණු 02ක් ඇසුරෙන් පැහැදිලි කරන්න

(ලකුණු 05)

iv .දඹදෙනියේ දෙවන පරාක්‍රමබාහු රජ සමයේ ශ්‍රී ලංකාවේ සිදු වූ දේශපාලනික හා අධ්‍යාපනික උන්නතිය කරුණු 02 ක් ඇසුරෙන් විස්තර කරන්න.

05 . i. මහනුවර රාජධානියේ ආරම්භක පාලකයන් තිදෙනා නම් කරන්. (ලකුණු03)

ii.මහනුවර රාජධානියේ රජු හට හිමි වූ බලකල 02ක් සඳහන් කරන්න . (ලකුණු 04)

iii. කන්ද උඩරට රාජධානියේ ප්‍රාදේශීය පාලනය සංවිධානය වී තිබූ ආකාරය කරුණු 02ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv . I විමලධර්මසූරිය රජු බලයට පත් වීමත් සමග මුහුණු දුන් අභියෝග 03ක් හා ඒවා ජය ගත් අකාරය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු06)

6.i. A- පෘතුගීසින් ලංකාවට පැමිණීමට පෙර මෙරට වෙළඳ ආධිපත්‍යය දිනා සිටි ජාතිය .

B- ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතිකයා .

C- පෘතුගීසින් ලංකාවට පැමිණෙන විට බලයේ සිටි කෝට්ටේ පාලකයා නම් කරන්න. (ලකුණු 03)

ii.පෘතුගීසි බලය මුහුදුබඩ පළාත් වල ව්‍යාප්ත වීමට බලපෑ හේතු 02ක් සඳහන් කරන්න. (ලකුණු04)

iii. A- සීතාවක රාජ්‍යයේ පාලකයන් දෙදෙනෙකු නම් කරන්න.

B-සීතාවක රාජධානියේ පිරිහීමට බලපෑ හේතු 03ක් ලියා දක්වන්න. (ලකුණු05)

iv.පෘතුගීසි මෙන්ම ලන්දේසි විසින් උඩරට රාජධානියට එල්ල කල ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු 03ක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

7. i. පහත සඳහන් දේශපාලනික සිදුවීම් සිදු වූයේ කවර දේශපාලන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල දැයි සඳහන් කරන්න.

A-ව්‍යවස්ථාදායක සභාව පිහිටුව වීම

B-පළාත් බද නියෝජන ක්‍රමයක් හඳුන්වා දීම

C- රාජ්‍ය මන්ත්‍රණ සභාව (ලකුණු 03)

ii. A-'ස්වරාජ්‍ය' සංකල්පය මත නිදහස් සටනක් දියත් කල පුද්ගලයා

B-රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ කෘෂිකර්මාන්ත හා ඉඩම් ඇමති

C - ශ්‍රී ලංකාවේ ප්‍රථම නාමමාත්‍රික ජනාධිපතිවරයා

D- ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා

ඉහත සිදුවීම් සම්බන්ද පුද්ගලයන් අනුපිලිවලින් ලියා දක්වන්න. (ලකුණු 04)

iii. A - නිදහසින් පසු ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් හඳුන්වා දුන් නවාංග 02ක් සහා

B- එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ අගමැති ධුර සමයේ හඳුන්වා දුන් ප්‍රතිපත්ති 03ක් ලියන්න. (ලකුණු 05)

iv.නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සමාජ ශුභසාධනය සිදු වූ ආකාරය පිලිබඳව කරුණු 02ක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

8. i. කාර්මික විප්ලවය සිදු වූ කර්මාන්ත 03ක් නම් කරන්න. (ලකුණු 03)

ii. පහත සඳහන් A,B,C හා D වලින් දක්වා ඇත්තේ කාර්මික විප්ලවයට හේතු වූ නිපැයුම් කිපයකි. ඒවා නිපද වීමට මුලික වූ පුද්ගල නාම වරහන් තුලින් තෝරා ලියන්න.

A - මියුල් යන්ත්‍රය B - රෝලර් යන්ත්‍රය

C -වාෂ්ප එන්ජිම D-දුම් බෝට්ටුව

(හෙන්රි බෙල් , හෙන්රි කෝට් , රොබට් පුල්ටන් , ජෝර්ජ් ස්ටීවන්සන්, ජෝන් කේ, ජේම්ස්වොට් , සැමුවෙල් ක්‍රොම්ප්ටන්) (ලකුණු 04)

iii. 18 වන සියවසේ ඇරඹි කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට හේතු 02 සාකච්චා කරන්න.
ලකුණු 05)

iv. කාර්මික විප්ලවය හේතුවෙන් ලොව පුරා ඇතිවූ දේශපාලන හා ආර්ථික ප්‍රතිපල කරුණු 02 ක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

9. i. පළමු වන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ මිත්‍රපිලේ රටවල් 03ක් නම් කරන්න. (ලකුණු 03)

ii. පළමුවන ලෝක සංග්‍රාමය අවසානයේ සාම ගිවිසුමක් ඇතිකර ගැනීමට පැරිස් නුවරට එක්වූ රටවල් වලට අදාළ නායකයන් වරහන් තුලින් තෝරා ලියන්න.

A-ඇමරිකා එක්සත් ජනපද ජනාධිපති

B- බ්‍රිතාන්‍ය අගමැති

C-ප්‍රංශ අගමැති

D-ඉතාලි අගමැති

(ලොයිඩ් ජෝර්ජ් , විටෝරියෝ ඕලැන්ඩෝ , ක්ලෙමන්ශෝ , ගැව්රිලෝ ප්‍රින්සිප් , වුඩ්රෝ විල්සන්) (ලකුණු 04)


iii. A-පළමුවන ලෝක සංග්‍රාමයේ අවසානයේ ඇති වූ සාම ගිවිසුම කුමක්ද ?

B- එම ගිවිසුමෙන් ජර්මනියට පැමිණ වූ දඩුවම් 03 ක් ලියා දක්වන්න. (ලකුණු 05)

iv. පළමුවන ලෝක සංග්‍රාමය ඇති වීමට තුඩු දුන් සාධක 03ක් සාකච්චා කරන්න. (ලකුණු 06)

31 . 07 . 2019
11 ශ්‍රේණිය
ඉතිහාසය

(01) (අ) (i) ප්‍රශ්නය සඳහා



(01) (අ) (ii) ප්‍රශ්නය සඳහා

